ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2402/05 - 2024 සැප්තැම්බර් මස 18 වැනි බදාදා - 2024.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

III වැනි කොටස - ඉඩම්

හිමිකම් ලියාපදිංචි කිරීම

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

14 වැනි වගන්තිය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 239 බී ගංගොඩගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගංගොඩගම නමැති ගමේ පිහිටියා වූ ද, අංක 620142 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 01 හි කැබලි අංක 25 දරන ඉඩම් කොටස් ලෙස පෙන්නුම් කොට ඇත්තා වූ ද, හිමිකම් පෑම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 55 වැනි වගන්තිය ප්‍රකාර 2024.04.26 වැනි දින අංක 2381/48 දරන *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළකරන ලද දැන්වීමේ සඳහන් කොට ඇත්තා වූ ද, ඉඩම් කොටස්වල අයිතිය සම්බන්ධයෙන් මෙහි උපලේඛනයේ දැක්වෙන මාගේ තීරණ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තියෙන් පහත අත්සන් කරන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මම මෙයින් ප්‍රකාශ කරමි.

පී. සී. ඩී. සිඟේරා,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 04 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 042708 - 04 (2024/09)

සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

ඉඩම් කොටසේ අංකය	*විශාලත්වය*	*අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම් සහ ලිපිනය*	*ජාතික හැඳුනුම්පත් අංකය*	*අයිති ඉඩමේ ප්‍රමාණය*	*අයිතියේ පන්තිය සහ ස්වභාවය*	*විනිශ්චයන් සහ ඉන්ජෙන්ෂන් නහනම් අපේක්ෂාවෙන් ඇති උකස් සහ බැඳීම් පිළිබඳ විස්තර*	*යම් විශේෂ හෝ පෞද්ගලික නීතියකට යටත් නම් ඒ පිළිබඳ විස්තර*
	(හෙක්ටයාර්)						
25	2.5501	මනන්නලාගේ තිළිණ දමිත් මධුශංක පනාන, වැලිගෙපොල, බලංගොඩ	872593578V	සම්පූර්ණ	ප්‍රථම පන්තිය	–	–

EOG 09-0122